සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

10 ශ්‍රේණිය **බුද්ධ ධර්මය - I** කාලය පැය 01 යි.

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. බුදු දහමේ මූලික අවධානය යොමු වී ඇත්තේ,

(1) ආගම ගැන ය. (2) ජාතිය ගැන ය. (3) සසර දුක ගැන ය. (4) කුලය ගැන ය.

02. බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සමයෙහි ''ගෞතමයන් වහන්ස, මේ මිනිස් ලොව ජීවත්වන හැම දෙනා ම එක සමාන නැත. සමහරුන්ට ආයුෂ අඩුයි. සමහරුන්ට වැඩියි. සමහරුන්ට ලෙඩ දුක් අඩුයි. සමහරුන්ට වැඩියි.'' වශයෙන් වෙනස්කම් පිළිබඳ ප්‍රශ්න කළේ,

(1) සුභ නම් මානවකයා ය. (2) සිගාලක නම් මානවකයා ය.
(3) යසකුල නම් මානවකයා ය. (4) උපතිස්ස නම් මානවකයා ය.

03. බුදුරදුන්ගේ දේශනාවට අනුව අකුසල කර්ම හෙවත් සසර දුක් උපදවන නරක අවැඩදායක සචේතනික ක්‍රියා

(1) පස් වැදෑරුම් ය. (2) අට වැදෑරුම් ය. (3) නව වැදෑරුම් ය. (4) දස වැදෑරුම් ය.

04. කුසලාකුසල කර්ම කිරීමට පුද්ගලයා පොළඹවන ප්‍රධාන මානසික මූලයන් ගැන ද බුදු දහමේ ඉගැන්වේ. ඒ අතරින් ''අලෝභය'' හඳුන්වා දී ඇත්තේ,

(1) සම්පත් පිළිබඳ ඇල්ම ලෙස ය. (2) නිර්ලෝභී බව, නොමසුරු ලෙස ය.
(3) පින් පවු විපාකාදිය නැතැයි සිතීම ලෙස ය. (4) මුලාවෙන් තොර වීම ලෙස ය.

05. වෙනත් කර්මයකින් වළකාලිය නොහැකි වඩාත් ශක්තිමත් බලසම්පන්න කුසලාකුසල කර්මයෝ හැඳින්වෙන නාමය කුමක් ද?

(1) ජනක කර්මය. (2) උපත්ථම්භක කර්මය.
(3) ගරුක කර්මය. (4) ආචිණ්ණ කර්මය.

06. ත්‍රිලක්ෂණ අවබෝධය බුදු දහමේ හැඳින්වෙන්නේ,

(1) ශ්‍රද්ධාව ලෙස ය. (2) ප්‍රඥාව ලෙස ය. (3) කර්මය ලෙස ය. (4) අනිත්‍යය ලෙස ය.

07. ආත්ම යනු සංස්කෘත භාෂාමය යෙදුමකි. එහි පාලි යෙදුම ''අත්ත'' යන්නය. ආත්මය සම්බන්ධයෙන් බුදු රදුන්ගේ දේශනාවට එකඟ **නොවන** ප්‍රකාශය තෝරන්න.

(1) මම යැයි ගත හැකි පදාර්ථයකි. (2) සත්ත්වයා පුද්ගලයා මම යනු සම්මුතියකි.
(3) සත්ත්වයා පුද්ගලයා මම යනු වචන මාත්‍රයකි. (4) මම යනු විශ්වාස මාත්‍රයකි.

08. මහරහත් අස්සජි තෙරණුවන් හමුවී ''ඔබ වහන්සේ පැවිදි වූයේ කවරෙකු උදෙසා ද? ඔබ වහන්සේගේ ගුරුතුමා කවරෙක් ද? කාගේ දහමක් ද ඔබ වහන්සේ රුචි කරන්නේ'' යනුවෙන් ප්‍රශ්න කළේ,

(1) කෝලිත නම් මානවකයා ය. (2) උපක නම් ආජීවකයා ය.
(3) උපතිස්ස නම් මානවකයා ය. (4) භාරද්වාජ නම් මානවකයා ය.

09. පටිච්ච සමුප්පාද යන යෙදුමෙන් ම නොකියවෙන්නේ,

(1) අහේතුක නොවන බව ය. (2) හේතු සහිත බව ය.

(3) සහේතුක බව ය. (4) හේතු රහිත බව ය.

10. බුදුරජාණන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි දී පස්වග භික්ෂූන් අමතා සිදුකළ මංගල ධර්ම දේශනාව වූයේ,

(1) මහා මංගල සූත්‍රයයි. (2) දම්සක් පැවතුම් සූත්‍රයයි.

(3) කරණීය මෙත්ත සූත්‍රයයි. (4) රතන සූත්‍රයයි.

11. දුක්ඛ නිරෝධාර්ය සත්‍යයෙන් විස්තර වන්නේ,

(1) දුක පිළිබඳ උතුම් සත්‍යයයි. (2) දුක නිවීම පිළිබඳ උතුම් සත්‍යයයි.

(3) දුක හටගැනීම පිළිබඳ උතුම් සත්‍යයයි. (4) දුක නිවීමේ මාර්ගය පිළිබඳ උතුම් සත්‍යයයි.

12. අංග අටකින් යුතු ආර්ය මාර්ගයේ සම්මා කම්මන්ත ආර්ය මාර්ගය සම්පූර්ණ කිරීම සඳහා වැළකිය යුතු අකුසල තුනට අදාල නොවන අකුසලය තෝරන්න.

(1) බොරුකීම. (2) පරපණ නැසීම.

(3) සොරකම් කිරීම. (4) වැරදි කාම සේවනය.

13. ඇතැම් කුමාරවරුන් විසින් සිදුකරනු ලැබූ සත්ව හිංසාව පිළිබඳ සිදුහත් බෝසතාණෝ කළකිරුණු අතර ඉන් පසු උයන් කෙළිය සඳහා ගියේ,

(1) ආනන්ද කුමරු සමඟ ය. (2) නන්ද කුමරු සමඟ ය.

(3) ඡන්න කුමරු සමඟ ය. (4) අනුරුද්ධ කුමරු සමඟ ය.

14. බුදුබව ලැබීමට පෙර දිනයේ බෝසතාණන් වහන්සේ දිවා විහරණය ගත කළ සුන්දර වනය වන්නේ,

(1) පාරිලෙය්‍ය වනයෙහි ය. (2) භද්‍ර වනයෙහි ය.

(3) සිංසපා වනයෙහි ය. (4) අම්බලට්ටික වනයෙහි ය.

15. බුදුරජාණන් වහන්සේ ජීවක අඹ උයනේ දී දේශනා කළ සූත්‍රයක් වන්නේ,

(1) සාමඤ්ඤඵල සූත්‍රය ය. (2) දම්සක් පැවතුම් සූත්‍රය ය.

(3) සෝණ දණ්ඩ සූත්‍රය ය. (4) ධනිය ගෝපාල සූත්‍රය ය.

16. ''ආරෝග්‍යා පරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං'' මෙම ගාථාව ඇතුළත් ග්‍රන්ථය කුමක් ද?

(1) දන්තකට්ට සූත්‍රය (2) චංකමානිසංස සූත්‍රය

(3) යාගු සූත්‍රය (4) ධම්ම පදය

17. අනුන්ගේ අත් උදව් නැති ව නැගිටින්නට බැරිතරමට අධික ව ආහාර ගන්නා තැනැත්තා හඳුන්වන්නේ,

(1) ආහාර හත්ථක නමිනි. (2) අලංසාටක නමිනි.

(3) කාකමාසක නමිනි. (4) භුත්තවමිතක නමිනි.

18. බුදුරජාණන් වහන්සේ විසින් විනයෙහි අනුදැන වදාරා ඇති සිරිත් විරිත් සමූහය ''සේඛියා'' නමින් හැඳින් වේ. එම සේඛියා වල ආහාර ගැනිමේ දී නොකළ යුතු දේවල් අතරට අයත් නොවන වරණය තෝරන්න.

(1) ආහාර ළංකිරීමට කලින් ම මුඛය විවෘත කිරීම.

(2) ආහාර ගන්නා විට අත්ල මුඛයට ඇතුළු කිරීම.

(3) ආහාර මුඛයෙහි තිබියදී කතා බහ කිරීම.

(4) අතගසා නොදමමින් ආහාර ගැනීම.

19. උතුම් අරමුණක් පෙරදැරි ව සිදුකළ සංගායනා පිළිබඳ ව ශාසන ඉතිහාසයේ සඳහන් වේ. ඒ අනුව ථේරවාදී බෞද්ධ සම්ප්‍රදාය මගින් පැවැත් වූ සංගායනා ගණන,

(1) 4 කි. (2) 5 කි. (3) 6 කි. (4) 7 කි.

20. ක්‍රි:පූ: පළමු සියවසේ බලයට පත් වළගම්බා රජු දෙවන වර බලයට පත් වීමට උපකාර කළ කුපික්කල මහා තිස්ස හිමියන්ට ප්‍රත්‍යුපකාරයක් සඳහා කරවා පුදකළ විහාරය වන්නේ,

(1) මහා විහාරය යි. (2) අභයගිරි විහාරය යි.

(3) ජේතවන විහාරය යි. (4) ලෝවාමහාපාය යි.

21. මෙරට පාලි ත්‍රිපිටකය ඉංග්‍රීසියට පරිවර්තනය කිරීමත්, මෑත යුගයේ දී ථේරවාදී බුදුදහම හැදෑරීමට හා ලොව පුරා ප්‍රචලිත කිරීමට මහා දායකත්වයක් දැක් වූ බ්‍රිතාන්‍ය ජාතික විද්වතෙකි

(1) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල්. (2) එච්. සී. පී. බෙල්.

(3) විලියම් ගයිගර්. (4) රීස් ඩේවිඩ්ස්.

22. ගර්භයේ ස්වරූපය අනුව ප්‍රධාන වශයෙන් ස්ථූප සයාකාර වේ. එයට අනුව ඝණ්ඨාකාර ස්ථූපය

(1) කලයක හැඩයක් ගනියි. (2) දිය බුබුලක හැඩයක් ගනියි.

(3) නෙල්ලි ගෙඩියක හැඩයක් ගනියි. (4) ඝණ්ඨාරයක හැඩයක් ගනියි.

23. මෙතෙක් හමු වී ඇති කලාත්මක බවින් උසස් ම බෝධිඝරය පිහිටා ඇති නගරය හා ගම කුමක්ද ?

(1) අනුරාධපුරය දිස්ත්‍රික්කයේ විලච්චිය ගම ය. (2) පොළොන්නරුවේ දිඹුලාගල ය.

(3) කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගම ය. (4) මහනුවර දිස්ත්‍රික්කයේ මැදවල ගම ය.

24. පාලි භාෂාවෙන් අඩ්ඪචන්දපාසාණ'' යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) කොරවක් ගල ය. (2) සඳකඩ පහණ ය. (3) පියගැටපෙළ ය. (4) වාහල්කඩ ය.

25. ''සීගිරිය'' හා ''හිඳගල'' විශේෂ තැනක් ගනු ලබන්නේ,

(1) සස, වෙස්සන්තර, සාම ජාතක කතා මෙහි නිරූපණය කරන නිසා ය.

(2) බුද්ධ චරිතයේ විවිධ අවස්ථාවන් නිරූපණය කරන නිසා ය.

(3) විශාලතම චිත්‍රාවලිය දක්නට ලැබෙන නිසා ය.

(4) අනුරාධපුර යුගයට අයත් සිතුවම් වර්තමානයේ හමුවන නිසා ය.

26. මෙරට පැරණිම සිංහල බෞද්ධ සාහිත්‍ය කෘති වශයෙන් සැලකෙන්නේ,

(1) සීහලට්ඨ කතා ය. (2) සියබස්ලකර ය.

(3) සිඛ වළඳ හා සිඛවළඳ විනිස ය. (4) දම්පියා අටුවා ගැටපදය ය.

27. ''එසේ හෙයින් යම් කෙනෙක් නුවණ මඳවත් කුසලච්ඡන්දය ඇති ව ධර්මාභියෝගයට උපදෙස් ලදිත් බණ දහන පින්කම් හැසිර නිවන් සාදාගනිත් නම්''...... යනුවෙන් අන්තර්ගත සෑම කථාවස්තුවකින් ම අරමුණ පිළිබිඹු කළ ග්‍රන්ථය වන්නේ,

(1) පූජාවලියයි. (2) සද්ධර්ම රත්නාවලියයි. (3) දහම් සරණයි. (4) බුත්සරණයි.

28. දීඝ නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ එන දළ්හනේමි සක්විති රජු පිළිබඳ ප්‍රවාද කතාව ඔස්සේ ඉදිරිපත් කරන රාජ්‍ය පරිපාලන ප්‍රතිපත්තිය නම් කරන්න.

(1) සප්ත අපරිහානීය ධර්ම. (2) දසරාජ ධර්ම.

(3) දස සක්විතිවත්. (4) සතර අගති.

29. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යනු

(1) සතර සතිපට්ඨාන නම් වේ. (2) සතර සංග්‍රහ වස්තු නම් වේ.

(3) සිවු බඹ විහරණ නම් වේ. (4) සිවු පසය නම් වේ.

30. බුදුරජාණන් වහන්සේ විසින් ''වඩාත් සමීප හේතු සාධක පමණක් සලකා බලා බුද්ධාදී රත්නත්‍රය පිළිබඳ නිගමනවලට නොඑළඹිය යුතු යැයි'' දේශනා කොට වදාළේ,

(1) ගිරිමානන්ද සූත්‍ර දේශනාවේදී ය. (2) ධජග්ග සූත්‍ර දේශනාවේදී ය.

(3) දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවේදී ය. (4) චූල්ලහත්ථිපදෝපම සූත්‍ර දේශනාවේදී ය.

31. සිගාලෝවාද සූත්‍රයට අනුව උතුරු දිසාව ලෙස හඳුන්වා දී ඇත්තේ,

(1) යහපත් මිතුරන් ය. (2) සේව්‍ය - සේවකයන් ය.

(3) ස්වාමි - භාර්යාවන් ය. (4) දූදරු - දෙමාපියන් ය.

32. දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම් පහට අයත් **නොවන** පිළිතුර වනුයේ,

(1) මව්පියන් පෝෂණය කිරීම.

(2) ඔවුන්ගේ කටයුතු සොයා බලා ඉටු කර දීම.

(3) මිය පරලොව ගිය දෙමාපියන්ට පින් අනුමෝදන් කරවීම.

(4) දෙමාපියන්ගෙන් අහිමි වූ දේ රැක ගැනීම.

33. ''අචරිත්වා බ්‍රහ්ම චරියං'' යන්නෙහි අදහස වන්නේ,

(1) මහා බ්‍රහ්මයා සමඟ අහිතවත් යන්න ය.

(2) නිවන් සුව නොලැබීම යන්න ය.

(3) උතුම් සීලාදී පිළිවෙතිහි නොයෙදී යන්න ය.

(4) බමුණන් සමග මනාප නොවන්නේය යන්න ය.

34. දුටුගැමුණු කුමරුවාණෝ ත්‍රිසිංහලය එක් සේසත් කොට රජු බවට පත් වූයේ කුමන සටනින් පසුව ද?

(1) අඹතොට නම් ස්ථානයේ කළ සටන (2) විජිතපුර නම් ස්ථානයේ කළ සටන

(3) ද්‍රෝණ නම් ගම කළ සටන (4) කසාතොට නම් ස්ථානයේ කළ සටන

35. 1753 දී සියම් රජ විසින් මෙරටට එවූ උපසම්පදාලාභී භික්ෂූන් වහන්සේලා විසි නමට නායකත්වය දුන් තෙරුන් වහන්සේ වන්නේ,

(1) උපාලි මහතෙරුන් වහන්සේ ය. (2) සීවලී මහතෙරුන් වහන්සේ ය.

(3) අනුරුද්ධ මහතෙරුන් වහන්සේ ය. (4) බුද්ධරක්ඛිත මහතෙරුන් වහන්සේ ය.

36. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ, ''ලෝකය, සත්වයා'' යැයි කියනු ලබන ධර්මයන් හඳුන්වන නාමය වන්නේ,

(1) ත්‍රිලක්ෂණයෝ ය. (2) පඤ්චේන්ද්‍රියෝ ය. (3) කර්මයෝ ය. (4) ස්කන්ධයෝ ය.

37. අපට සංසාරගත දුකින් මිදී නිවන් දැකීමට උපකාරී වන භාවනාව වන්නේ,

(1) ආනාපාන සති භාවනාව ය. (2) සමථ භාවනාව ය.

(3) විපස්සනා භාවනාව ය. (4) මෛත්‍රී භාවනාව ය.

38. උද්ධච්ච කුක්කුච්ච නමින් හැඳින්වෙන්නේ,

(1) නොසන්සුන් කම ය. (2) නිදිබර උදාසීන කම ය.

(3) වැනෙන සුළු ගතිය ය. (4) ප්‍රකෝපකාරී ස්වභාවය ය.

39. නිවන් මග පසක් කිරීමට අවශ්‍ය වන මනා වූ පිළිවෙත් රකින බැවින් සඟ රුවන

(1) උජුපටිපන්න නම් වේ. (2) ඤායපටිපන්න නම් වේ.

(3) සාමීචි පටිපන්න නම් වේ. (4) සුපටිපන්න නම් වේ.

40. සුද්ධෝදන රජතුමාගේ එකම සිහිනය වූයේ තම පුත් කුමරු

(1) බුදු කෙනෙකුන් වහන්සේ වනවා දැකීමට ය.

(2) සක්විති රජ කෙනෙකු වනවා දැකීමට ය.

(3) ප්‍රාඥයෙකු වනවා දැකිමට ය.

(4) වීරයෙකු වනවා දැකිමට ය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2019
10 ශ්‍රේණිය **බුද්ධ ධර්මය - II** කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

(01) (i) සිදුහත් කුමාරයා ස්වයංවරයකින් තෝරාගත් කුමරිය හැඳින්වීම සඳහා භාවිතා කරන නම් දෙකක් ලියන්න.

(ii) සතර අගති නම් කරන්න.

(iii) ''රහසත් පව් නොකොට - කෙලෙසරයනුත් දුරු කොට''

මෙම කවිය සම්පූර්ණ කර ලියන්න.

(iv) භාවනා කළ හැකි සතර ඉරියව් නම් කරන්න.

(v) අනිච්චාවත සංඛාරා - උප්පාද වයධම්මිනෝ

උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - තේසං වූපසමෝ සුඛෝ

මෙම ගාථාව ඇතුළත් සූත්‍රය කුමක් ද?

(vi) පමණ දැන ආහාර ගන්නා ලෙස බුදුරජාණන් වහන්සේ අවවාද කළේ කා හට ද?

(vii) එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම (Pali Text Society) පිහිටුවා ගනු ලැබුවේ කවුරුන් විසින් ද?

(viii) ''භාවේති කුසල ධම්මේ ආසේවති වඩ්ඪේති ඒතායතාති භාවනා'' මෙම පාඨයේ අදහස ලියන්න.

(ix) පූජාවලිය රචනා කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(x) ඉන්දියාවේ පැරණි අජන්තා සිතුවම් වලට නෑකම් කියන චිත්‍ර ලංකාවේ හමුවන්නේ කුමන ස්ථානයෙන් ද? (ලකුණු 2 x 10 = 20)

(02) (i) බෝසත් උපත සිදුවූ විගස සිදු වූ සිදුවීම් දෙකක් ලියන්න.

(ii) සිදුහත් කුමරු ජයගත් අභියෝග තුනක් ලියන්න.

(iii) ''ළමා අවදියේ සිටම අභියෝග ජය ගැනීම ජීවිතයට අවශ්‍ය ගුණයකි.'' සිදුහත් කුමාර අවධිය ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

(03) (i) ගර්භයේ ස්වරූපය අනුව ප්‍රධාන වශයෙන් ස්තූප සයාකාර වේ. ඉන් ආකාර දෙකක් ලියන්න.

(ii) අංග සම්පූර්ණ ස්තූපයක රූප සටහනක් ඇඳ එහි අංග නම් කරන්න.

(iii) ලොවක් මවිතයට පත් කළ ශ්‍රී ලාංකික කලා ශිල්පීන්ගේ කලා කුසලතා ඇගයීමට ලක් කරන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

(04) (i) ''ආරෝග්‍යා පරමා ලාභා'' යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(ii) එම ගාථාවේ තේරුම ලියන්න.

(iii) සමස්ත මානව වර්ගයාටම පරිහරණය කළ හැකි වටිනා උපදෙස් ඇතුළත් ග්‍රන්ථයක් ලෙස ''ධම්මපදය'' ඇගයීමට ලක් කරන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

(05) (i) පළමුවන හා දෙවන ධර්ම සංගායනා පැවැත් වූ ස්ථාන නම් කරන්න.

(ii) අලුවිහාර සංගීතිය හෙවත් සිව් වන ථේරවාද සංගීතියේ ප්‍රතිඵල 3 ක් ගෙන හැර දක්වන්න.

(iii) ධර්ම සංගායනා මගින් ශාසනයේ සුරක්ෂිත බව තහවුරු කරන ලද අයුරු පහදන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(06) (i) සිව් සඟරාවත් නම් කරන්න.

(ii) ඉහත (i) හි දැක් වූ කරුණු වලින් එක් කරුණක් පැහැදිලි කරන්න.

(iii) රාජ්‍ය පාලකයකුට සියලු රටවැසියන් තමන්ගේ දරුවන් ලෙස සිතා කටයුතු කිරීමේ වැදගත් කම ''සිව් සඟරාවත්'' ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

(07) පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) වැලිවිට සරණංකර මාහිමි

(ii) මුරගල

(iii) චතුරාර්ය සත්‍යය

(iv) කව්සිළුමිණ (ලකුණු 5 + 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(4) | 4 -(2) | 5 -(3) | 6 -(2) | 7 -(1) | 8 -(3) | 9 -(4) | 10 -(2) |
| 11-(2) | 12 -(1) | 13 -(3) | 14 -(2) | 15 -(1) | 16 -(4) | 17 -(1) | 18 -(4) | 19 -(3) | 20 -(2) |
| 21-(4) | 22 -(1) | 23 -(3) | 24 -(2) | 25 -(4) | 26 -(1) | 27 -(2) | 28 -(3) | 29 -(3) | 30 -(4) |
| 31-(1) | 32 -(4) | 33 -(3) | 34 -(2) | 35 -(1) | 36 -(4) | 37 -(3) | 38 -(1) | 39 -(4) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i) හද්දකච්චානා / යසෝදරා

(ii) ඡන්දය, ද්වේශය, භය, මෝහය

(iii) රහසත් පව් නොකොට
කෙලෙසරයනුත් දුරු කොට
නිසි වුයෙන් පුදට
අරහ යන නම කියති මුනිඳුට

(iv) සක්මන් ඉරියව්ව, සිටි ඉරියව්ව, වාඩිවී හිඳීමේ ඉරියව්ව, වැතිරී සිටීමේ ඉරියව්ව (යාම, ඊම්, ඉදීම්, හිටීම්)

(v) පරිනිබ්බාන සූත්‍රය

(vi) කොසොල් මහ රජුට

(vii) රිස් ඩේවිඩ්ස් පඬිතුමා

(viii)කුසල් දම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාවයි.

(ix) මයුරපාද පිරිවෙන්පති බුද්ධ පුත්‍ර හිමියන්

(x) සීගිරි චිත්‍ර (ලකුණු 2 x 10 = 20)

02. (i)
* උපත ලද විගස පියවර තැබීම
* සත් පියුම් පිපීම
* සිහනාද පැවැත්වීම

(ii)
* උපත
* පෙරනිමිති දැකීම
* පස්කම් සුව අතහැරීම
* ශිල්ප හැදෑරීම
* නිබ්බුත පද ඇසීම
* පිය රජුගේ අපේක්ෂාවන් ඉටු කිරීම

(iii) උපත, ශිල්ප හැදෑරීම. පෙර නිමිති දකීම, නිබ්බුත පද ඇසීම, පස් කම් සුව අත් හැරීම, පිය රජුගේ අපේක්ෂාවන් ඉටු කිරීම, ආදී විවිධ අභියෝග වලට මුහුණ දීමට සිදුහත් බෝසතුන්ට ළමා අවධියේ සිටම සිදු විය. එම අභියෝග ජය ගැනීමට කැපවීම, අධිෂ්ඨානය හා නිවැරදි ගමන් මඟ ද ඔස්සේ එම අභියෝග ජය ගැනීමට එතුමාණෝ සමත් වූහ. එය අප සැමට ආදර්ශයකි. (පළමු පාඩම පිටු අංක 2 ට අනුව සමස්ථය සලකා ලකුණු ප්‍රදානය කරන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

03. i. ගර්භයේ හැඩය අනුව ස්තූප හයකට බෙදා දක්වේ.

| | | | |
|---|---|---|---|
| 01. | ඝණ්ඨාකාර | - | ඝණ්ඨාරයක (සීනුවක) හැඩය ඇති |
| 02. | ඝටාකාර | - | කළයක හැඩය ඇති |
| 03. | බුබ්බුලාකාර | - | දියබුබුලක හැඩය ඇති |
| 04. | ධාන්‍යාකාර | - | ධාන්‍ය ගොඩක හැඩය ඇති |
| 05. | පද්මාකාර | - | පියුමක හෙවත්, නෙළුම් මලක හැඩ ඇති |
| 06. | ආමලකාකාර | - | නෙල්ලි ගෙඩියක හැඩය ඇති |

(ල. 02)

ii.




(ල. 03)

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

(iii) ශ්‍රී ලාංකික සංස්කෘතියේ ප්‍රෞඪත්වය විදහාපාන කලා ශිල්ප අපේ කලා ශිල්පීන්ගේ විශිෂ්ට නිර්මාණයක් බව පෙන්වා දිය හැකිය. ඒ අතර වාස්තු විද්‍යාත්මක නිර්මාණ වූ ස්තූප, බුද්ධ ප්‍රතිමා, චිත්‍ර, මූර්ති, කැටයම්, ගෘහ නිර්මාණයන් දෙස් විදෙස් සැමගේ ඇගයීමට ලක්වන සුවිශේෂ නිර්මාණ බව පෙන්වා දිය හැකිය. (20 වන පාඩමේ සඳහන් කරුණු උපයෝගී කරගෙන පිළිතුරු සපයා ඇත්නම් සමස්තයක් ලෙස සලකා ලකුණු ලබාදෙන්න.) (ලකුණු $2+3+5=10$)

(04) (i) ආරෝග්‍යා පරමා ලාභා සන්තුට්ඨී පරමං ධනං
විස්සාස පරමා ඤාති නිබ්බාණං පරමං සුඛං

(ii) ලාභයන් අතරින් නිරෝගී බව උතුම් ය. ධන සම්පත් අතරින් සතුට ශ්‍රේෂ්ඨ ය. ඥාතීන් අතරින් විශ්වාසවන්තයා උතුම් ය. ලෝකයේ හැම සැපතට ම වඩා නිවන් සැපය උතුම් වේ.

(iii) ධම්මපදය සියලු දෙනාට පරිහරණය කළ හැකි වටිනා උපදෙස් ඇතුළත් ග්‍රන්ථයක් ලෙස සැලකිය හැකිය. පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය උපදෙස් එහි ඇතුළත් ය. ධම්මපද ගාථා මගින් ඉදිරිපත් කරන ජීවිතාදර්ශ ජාති, ආගම් ආදී කිසිදු භේදයකින් තොරව සමස්ත මානව වර්ගයාට ම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි ආචාර ධර්ම වේ. (10 ශ්‍රේණිය 7 පාඩම ඇසුරෙන් පිළිතුරු සකස් විය යුතුය.) (ලකුණු $2+3+5=10$)

(05) (i) පළමු සංගායනාව - රජගහනුවර සප්ත පර්ණී ගල්ගුහා ද්වාරයේ (ගල් ගුහාව ඉදිරිපිට)
දෙවන සංගායනාව - විශාලා මහනුවර වාලුකාරාමයේ දී

(ii)
* ධර්මය ග්‍රන්ථාරූඪ වීම.
* ධර්මයේ විකෘතිතාවයන් ඇති නොවී ආරක්ෂා විම.
* ථේරවාද බුදු දහම විෂයයෙහි එල්ල වීමට තිබූ අභියෝග අවම වීම.
* වෙනත් රටවල ධර්ම ප්‍රචාරය සඳහා ත්‍රිපිටක ග්‍රන්ථ උපකාරී වීම.
* ත්‍රිපිටකය ඉංග්‍රීසි භාෂාවට පරිවර්ථනය කිරීම සඳහා උපකාරී වීම.

(iii) ශාසන ඉතිහාසය තුළ සංගායනා ගණනාවක් පිළිබඳ තොරතුරු දැක්වේ. එම සියලු සංගායනා මගින් තහවුරු වන්නේ ශාසනයේ චිරස්ථිතිය හා ව්‍යාප්තිය උදා කරලීමට හේතු වී ඇත. සාකච්ඡා මාර්ගයෙන් විසඳුම් සෙවීම හා සුරක්ෂිත කළ යුතු ධර්ම විනය සුරක්ෂිත කිරීම සංගායනා පැවැත්වීමට හේතු වූ බව පැහැදිලි වේ. (පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.) (ලකුණු $2+3+5=10$)

(06) (i) දානය / ප්‍රිය වචනය / අර්ථචරියාව / සමානාත්මතා

(ii) 10 ශ්‍රේණිය 22 පාඩමේ 128 පිටුවේ සඳහන් තොරතුරු අනුව ලකුණු ලබා දීම සිදු කරන්න.

(iii) පාලකයකු සතුවිය යුතු වැදගත් ප්‍රතිපත්තියක් ලෙස හිමි සිව්සඟරාවත හඳුන්වා දිය හැකිය. එම ප්‍රතිපත්ති එකිනෙකට විස්තර කරමින් කරුණු දක්වා තිබීම ඉතා වැදගත් වේ. රටවැසියන් තමන්ගේ දරුවන් ලෙස සිතා කටයුතු කිරීමේ උතුම් මනෝභාවයක් ගොඩ නැගේ. එවිට පිය පුතු සබඳතාවයෙන් යුතුව ජනතාව සේවය කිරීමේ අවස්ථාව පාලකයාට උදාවේ. (පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ලබාදෙන්න.) (ලකුණු $2+3+5=10$)

(07) (i) වැලිවිට සරණංකර මාහිමි
1698 ජුනි 18 දින තුන්පනේ වැලිවිට ගමේ කුලතුංග බංඩාර නමින් උපත ලබා වයස අවුරුදු 16 දී පැවිදි බිමට පත්විය. බොහෝ දුෂ්කරතා මධ්‍යයේ සිංහල, පාලි. සංස්කෘත, කාව්‍ය ශාස්ත්‍රය පිළිබඳ ඉගෙනීම ලැබීය. එකල උපසම්පදාව පවා අහිමි විය. පිරිහිගිය භික්ෂු සමාජය දුරලා යලි උපසම්පදාව ඇති කොට ශාසනය ආරක්ෂා කරගැනීමට උන්වහන්සේ මුල්විය. මේ නිසා කීර්ති ශ්‍රී රාජසිංහ රජු සංඝරාජ පදවියෙන් පුදනු ලැබීය. ''උඩගු නොව මහණ'' යන නිහතමානි බවින් ක්‍රියා කළ උන්වහන්සේ මුණිගුණ අලංකාරය, සාරාර්ථ සංග්‍රහය, රත්නත්‍රය ප්‍රණාම ගාථා සන්නය, සතර බණවර සන්නය ආදී පොත් පත් ලියමින් ධර්ම ශාස්ත්‍රීය සේවාවක නිරත වී සිට 1778 ඇසල පොහෝ දින අපවත් විය.

(ii) විහාර මන්දිරයක හෝ රාජකීය ගොඩනැගිල්ලක දොරටු අලංකාර කරන අර්ධ කවාකාර මුදුන සහිත ගල්පෝරු දෙක මුරගල නමින් හැඳින්වේ. (මේ පිළිබඳව 10 ශ්‍රේණියේ 20 පාඩමේ 114 පිටුවේ දෙවන ඡේදය කියවන්න.)

(iii) 10 ශ්‍රේණියේ 15 පාඩම ඇසුරෙන් පිළිතුර සකස් වී තිබිය යුතුය.

(iv) 10 ශ්‍රේණිය 21 පාඩම 122 පිටුවේ තුන්වන ඡේදය ඇසුරෙන් පිළිතුර සකස් වී තිබිය යුතුය. (ලකුණු $5+5=10$)